(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 78.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 අගෝස්තු 22 සිකුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

846/2025

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති, රාජ්‍ය වැවිලි සමාගම් සතු ඉඩම් ප්‍රමාණය එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සමාගම් සතු ඉඩම් අතුරු බදුදී තිබේ නම්, එම ඉඩම් ප්‍රමාණය, අතුරු බදු ලබා ගෙන ඇති සමාගම්/ආයතනවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අතුරු බදුදී ඇති ඉඩම් වෙනුවෙන් 2015 වර්ෂයේ සිට මේ දක්වා ලැබුණු බදු ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත බදු ආදායම නිසි පරිදි අය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1024/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන ප්ලාස්ටික් හා පොලිතින් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ප්ලාස්ටික් හා පොලිතින් භාවිතය අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ප්ලාස්ටික් යොදා නිෂ්පාදනය කරනු ලබන කුඩා දරුවන්ගේ ආහාර අසුරණවල ප්‍රමිතිය සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1068/2025

ගරු වානක මාදුගොඩ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් හිමියන් විසින් රජයට භාර දෙන ලද ඉඩම් බලපත්‍ර, දීමනා පත්‍ර සහ ඔප්පු වෙනුවට 'උරුමය' වැඩසටහන යටතේ සින්නක්කර ඔප්පු ලබා දීමට මේ වනතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව පිළිගන්නේද;

(ii) එසේ ඉඩම් බලපත්‍ර, දීමනා පත්‍ර සහ ඔප්පු භාර දෙන ලද පුද්ගලයන්ගේ ඉඩම් හිමිකම තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) ඉහත සඳහන් ඉඩම් බලපත්‍ර, දීමනා පත්‍ර සහ ඔප්පු වෙනුවට සින්නක්කර ඔප්පු ලබා දීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට නිශ්චිත කාල රාමුවක් තිබේද;

(iv) සින්නක්කර ඔප්පු ලබා ගැනීම පිණිස රජයට භාර දෙන ලද ඉඩම් බලපත්‍ර, දීමනා පත්‍ර සහ ඔප්පු සම්බන්ධයෙන් වන වර්තමාන තත්ත්වය පිළිබඳව අදාළ පුද්ගලයන්ට තොරතුරු ලබා ගත හැකි මාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1070/2025

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම් කටයුතු නතර කර ඇති සහ මේ වනවිට භාවිතා කරනු නොලබන මාතර, නාවිමන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වැය කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එම මුල්‍ය පිරිවැය දරා ඇති ආයතන කවරේද;

(iii) එම ගොඩනැගිලි සංකීර්ණය නඩත්තුව සහ ආරක්ෂාව වෙනුවෙන් වාර්ෂිකව දරන පිරිවැය කොපමණද;

(iv) ඉහත ගොඩනැගිලි සංකීර්ණය භාවිතයට ගැනීම සඳහා පවතින සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1073/2025

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ අරමුණු කවරේද;

(ii) නාගරික සංවර්ධන අධිකාරිය විසින් මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන එක් එක් සංවර්ධන ව්‍යාපෘතියේ නම සහ ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ව්‍යාපෘති අතරින් මාතර නගර සීමාව තුළ ක්‍රියාත්මක කර ඇති එක් එක් ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය, ව්‍යාපෘතියේ ස්වභාවය, ව්‍යාපෘතියේ අරමුණ, ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල හා ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මාතර 'ගහබඩ උද්‍යානය' සහ 'තුරුණු උයන' යන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු ඉටුවී තිබේද;

(v) එම එක් එක් ව්‍යාපෘතියේ පරිපාලන ව්‍යුහය හා ඊට සම්බන්ධ පුද්ගලයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1076/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේදී පවත්වන ලද විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් පසුව උතුරු පළාතේ සෞඛ්‍ය සහායක සේවා (III ශ්‍රේණිය) ස්ථිර තනතුරට බඳවාගැනීම සඳහා තෝරාගන්නා ලද සෞඛ්‍ය සහායකයන් 454 දෙනෙකු මේ වනතෙක් බඳවාගෙන නොමැති බවත්;

(ii) මුදල් අමාත්‍යාංශයේ අනුමතිය නොලැබීමෙන් ඉහත බඳවාගැනීම් ප්‍රමාද වී ඇති බවත්;

(iii) ඉහත තනතුරේ පුරප්පාඩු 643ක් පැවතීම, උතුරු පළාතේ සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාමට බාධාවක්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2019 වර්ෂයේ ලබාදී ඇති පත්වීම් ලිපි නොසලකමින් මෙම සෞඛ්‍ය සහායකයන් බඳවාගැනීමට බාධාවක්වී ඇති පරිපාලන හෝ නීත්‍යානුකූල හේතු කවරේද;

(ii) ඔවුන් කඩිනමින් බඳවාගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1084/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් වවුනියාවේ, තච්චංකුලම් ගුවන් තොටුපළ පුළුල් කිරීම සඳහා ඒ අවට පෞද්ගලික ඉඩම් අත්පත් කර ගන්නා ලද අතර එහිදී දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ මහජනතාව විසින් භාවිතා කරන ලද මාර්ග භාවිතා කිරීමද තහනම් කර තිබෙන බවත්;

(ii) විශේෂයෙන්ම තච්චංකුලම්-මූන්රුමුරිප්පු ප්‍රධාන මාර්ගය භාවිතා කිරීම දීර්ඝ කාලයක් තිස්සේ මහජනතාවට තහනම් කර තිබෙන බවත්;

(iii) ඒ හේතුවෙන් තච්චංකුලම් ගම්මානයේ ජීවත්වන ජනතාවට තමන්ගේ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරි කාර්යාලයට යාමට කිලෝමීටර් දෙකක් වෙනුවට කිලෝමීටර් දොළහක් ගමන් කිරීමට සිදුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත සඳහන් තච්චංකුලම්-මුන්රුමුරිප්පු ප්‍රධාන මාර්ගය මහජනතාවගේ භාවිතය උදෙසා විවෘත කිරීමට පියවර ගන්නේද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1092/2025

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ‘කුඩාඔය’ ගඟේ සිට ‘දෙබරආර’ වැව දක්වා කපන ලද ඇළ මාර්ග ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) ඒ සඳහා වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයන ලද මූලාශ්‍ර කවරේද;

(iv) එම ව්‍යාපෘතියේදී නිසි ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කරනු ලැබ තිබේද;

(v) එසේ නම්, ඒ පිළිබඳ තොරතුරු සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු කවුරුන්ද;

(ii) එම ව්‍යාපෘතියේ තාක්ෂණික සහාය හා අධීක්ෂණය සපයන ලද ආයතනය කවරේද;

(iii) මෙම ඇළ මාර්ගය කැපීමේදී ඉවත් කරන ලද කළුගල් හා පස් බැහැර කරන ලද ආකාරය කවරේද;

(iv) මේ වනවිට එම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කරගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1103/2025

ගරු සුරංග රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වර්තමාන ජනාධිපතිවරයාගේ පසුගිය ජර්මානු සංචාරයෙන් ලැබුණු ප්‍රතිලාභ කවරේද;

(ii) එම සංචාරය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම සංචාරයේදී ජනාධිපතිවරයා හමුවූ රාජ්‍ය නායකයන් කවුරුන්ද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1117/2025

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලිසියේ සේවය කර විශ්‍රාම ගොස් සිටින විශාල පිරිසක් පෞද්ගලික ආරක්ෂක සේවාවල සේවය කරන බව දන්නේද;

(ii) ඔවුන්ට සාධාරණ වැටුපක්, ප්‍රමාණවත් පහසුකම්, නිසි පුහුණුවක් සහ නිසි පිළිගැනීමක් ලැබෙන්නේද;

(iii) පෞද්ගලික ආරක්ෂක සේවා නියාමනය කිරීමේ ක්‍රමවේදයක් තිබේද;

(iv) නොඑසේ නම්, නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පෙ.ව. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

ජාතික විගණන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*5.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***